අ.පො.ස.(සා.පෙළ) පෙරහුරු ප්‍රශ්න පත්‍රය - 2020
කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය (81) – I, II

මෙය අධ්‍යාපන අමාත්‍යාංශයේ කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාවේ මෙහෙයවීමෙන් සකස් කරන ලද්දකි.

පැය තුනයි

උපදෙස්:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට (1) (2) (3) (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන හෝ පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

1. ශ්‍රී ලංකාවේ විශාලතම බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය වන්නේ,
   (1) ගල් ඔය යෝජනා ක්‍රමය යි.
   (2) මහවැලි යෝජනා ක්‍රමය යි.
   (3) උඩවලව යෝජනා ක්‍රමය යි.
   (4) මුතුකණ්ඩිය යෝජනා ක්‍රමය යි.

2. පහත A, B, C යන රූප සටහන්වලින් දැක්වෙන කාලගුණික දත්ත ලබා ගැනීමේ උපකරණ අනුපිළිවෙලින් සඳහන් කර ඇති වරණය තෝරන්න.

A

B



C



   (1) සූර්ය දීප්තමානය, අනිල මානය, ආර්ද්‍රතාමානය
   (2) සුළං දිශා දර්ශකය, උපරිම අවම උෂ්ණත්වමානය, උෂ්ණත්වමානය
   (3) සූර්ය විකිරණමානය, සූර්ය දීප්තමානය, අනිල මානය
   (4) තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය, සූර්ය දීප්තමානය, වර්ෂාමානය

3. ශ්‍රී ලංකාවේ පහතරට අතරමැදි කලාපයට ලැබෙන වාර්ෂික වර්ෂාපතන ප්‍රමාණය,
   (1) මි.මී. 2500 ට වැඩි ය.
   (2) මි.මී. 1750 – මි.මී. 2500අතර ය.
   (3) මි.මී. 900 – මි.මී. 1750 අතර ය.
   (4) මි.මී. 1750 ට අඩු ය.

4. ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ක්‍රම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. ඒ අතරින් නිවැරදි වගන්තිය කුමක්ද?
   (1)නිරිත දිග මෝසම මගින් කඳුකරයේ නැගෙනහිර බෑවුමට හා උතුරු මැද ප්‍රදේශයට වැසි ලැබෙයි.
   (2)වියළි කලාපයේ මහ කන්නයේ වගා කටයුතු ආරම්භ කරනු ලබන්නේ නිරිත දිග මෝසම් වැසි සමඟ ය.
   (3)අන්තර් මෝසම් වැසි අඛණ්ඩව දින කිහිපයක් පවතියි.
   (4)වායුගෝලයේ ඇතිවන පීඩන අවපාත නිසා වාසුළි ඇති වේ.

5. බෝග වගාව සඳහා අවශ්‍ය පාංශු ජලය පිළිබඳව පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය කුමක්ද?
   (1) පස ජලයෙන් සංතෘප්ත වූ විට පාංශු වාතය නොමැති නිසා ශාක මුල්වලට ශ්වසනය කළ නොහැකි ය.
   (2) පස ක්ෂේත්‍ර ධාරිතා තත්ත්වයේ පවතින විට දී බෝග සඳහා ජල සම්පාදනය කළ යුතු ය.
   (3) ස්ථිර මැලවීම සිදු වූ ශාකයක් ජල සම්පාදනය මගින් යථා තත්ත්වයට පත් කළ හැකි ය.
   (4) උඳුනක වියළා ගත් පස් නියැදියක ජලාකර්ෂක ජලය පමණක් ඉතිරි වී ඇත.

6. මැටි හා හියුමස් කලිල අතර සමාන ලක්ෂණ වන්නේ, එම කලිල වර්ග දෙකම,
   (1) කාබනික කලිල වීම ය.
   (2) ඛනිජවලින් සෑදී තිබීම ය.
   (3) විෂ්කම්භය මි.මී. 0.002 ට අඩු වීම ය.
   (4) ෂඩස්‍රාකාර හැඩයෙන් යුතු වීම ය.

7. මනාව සංවර්ධනය වූ පාංශු පැතිකඩක විශෝධන කලාපය පිළිබඳව නිවැරදි ප්‍රකාශය කුමක් ද?
   (1) එහි මාතෘ පාෂාණය ජීර්ණය වීමෙන් සෑදුනු ඛනිජ පමණක් ඇත.
   (2) කාබනික ද්‍රව්‍ය බහුලව ඇති නිසා විශෝධන කලාපය කළු පැහැයට හුරු ය.
   (3) එය මාතෘ පාෂාණය හා සංචායක කලාපය අතර පිහිටයි.
   (4) එහි ඉහළ ස්ථරයෙන් සේදී යන ද්‍රව්‍ය තැන්පත්ව ඇත.

8. නයිස් යනු ශ්‍රී ලංකාවේ සුලබ විපරිත පාෂාණයකි. නයිස් පාෂාණය සෑදෙන්නේ පහත කුමන පාෂාණය විපරිත වීමෙන් ද ?
   (1) ක්වාට්ස්
   (2) ග්‍රැනයිට්
   (3) පෙග්මටයිට්
   (4) ඩොලමයිට්

9. රුටේසියේ, කුලයට අයත්වන බෝග කිහිපයකි,
   (1) ඉඟුරු, කහ හා එණු
   (2) දෙහි දොඩම් හා දිවුල්
   (3) පුවක්, පොල් හා කිතුල්
   (4) මිරිස්, බටු හා තක්කාලි

10. යන්ත්‍ර බලයෙන් ක්‍රියාකරවන ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණ යුගලය වන්නේ,
   (1) තැටි නගුල හා රොටවේටරය ය.
   (2) ජපන් පරිවර්ත්‍ය නගුල හා ජපන් රොටරි වීඩරය ය.
   (3) හැඩ ලෑලි නගුල හා තැටි නගුල ය.
   (4) රිජරය හා කොකු නගුල ය.

11. බෝග සංස්ථාපනය පිළිබඳ සත්‍ය වගන්තිය තෝරන්න.
   (1) බෝග සංස්ථාපන උපකරණ භාවිත කර බෝග සිටුවා ගැනීමෙන් කාලය හා ශ්‍රමය ඉතිරි වේ.
   (2) බීජ වප්කරය භාවිත කර ගොයම් පැළ සිටුවා ගත හැකි වේ.
   (3) මුං ඇට හා කව්පි, බීජ සිටුවා ගැනීමට සෑම විටම බීජ වප්කරයක් භාවිත කළ යුතු වේ.
   (4) අන්නාසි පැළ සංස්ථාපනය පහේ බෙදුම් ක්‍රමයට සිදු කරනු ලැබේ.

12. තවාන් පාත්ති ජීවානුහරණය කිරීමේ දී හිතකර පාංශු ජීවීන් බොහොමයක් ඉතිරි වී ව්‍යාධිජනක පාංශු ජීවීන් විනාශ වන්නේ පහත කුමන ක්‍රමය අනුගමනය කිරීමෙන් ද?
   (1) තවාන් පසට නටන උණු ජලය දැමීම
   (2) තවාන් පස පිළිස්සීම
   (3) සූර්ය තාපය මගින් පස ජීවානුහරණය කිරීම
   (4) රසායනික ද්‍රව්‍ය පසට එක් කිරීම

13. වී වගාවේ දී යන්ත්‍රානුසාරයෙන් පැළ සිටුවා ගැනීම සඳහා බීජ පැළ ලබා ගැනීමට භාවිත කරන තවාන් වර්ගය වනුයේ,
   (1) නෙරිඩෝකෝ තවාන ය.
   (2) ඩැපොග් තවාන ය.
   (3) තැටි තවාන ය.
   (4) මඩ තවාන ය.

14. විසිරි ජල සම්පාදනය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.
   A - ඇලි ජල සම්පාදනය හා සැසඳීමේ දී කාර්යක්ෂමතාවය වැඩි ය.
   B - පාංශු ඛාදනය සිදු වේ.
   C - පොහොර හා කෘෂි රසායනික ද්‍රව්‍ය ද ජලය සමග යෙදිය හැකි ය.

   ඉහත වගන්ති අතරින් වඩාත් නිවැරදි වන්නේ,
   (1) A හා B පමණි.
   (2) B හා C පමණි.
   (3) A හා C පමණි.
   (4) සියලුම ප්‍රකාශ නිවැරදි ය.

15. බෝග වගාවේ දී යොදා ගනු ලබන ජල සම්පාදන ක්‍රම කිහිපයක් පහත දක්වා ඇත.
   A. පස තුළින් සවිවර නළ යෙදීම
   B. ඇලි හා වැටි ජල සම්පාදනය
   C. බිංදු ජල සම්පාදනය
   D. බේසම් ජල සම්පාදනය
   ඉහත ජල සම්පාදන ක්‍රම අතුරින් පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රම වනුයේ,
   (1) A සහ B පමණි.
   (2) B සහ C පමණි.
   (3) C සහ D පමණි.
   (4) B සහ D පමණි.

16. දොඩම් ශාකයක මේරූ පත්‍ර කහ පාට වී, මල් හා ඵල විකෘති වී, වර්ධනය අඩු වී, ශාක කුරු වී ඇති බව නිරීක්ෂණය විය. මෙම ලක්ෂණ අනුව පවතින පෝෂක ඌනතාවය විය හැක්කේ,
(1) නයිට්‍රජන් (N) ය. (2) කැල්සියම් (Ca) ය.
(3) පොස්පරස් (P) ය. (4) පොටෑසියම් (K) ය.

17. රසායනික පොහොර භාවිතයේ වාසි පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.
A - රසායනික පොහොර ඉක්මනින් ශාකවලට අවශෝෂණය වේ.
B - ශාක දක්වන ඌනතාවලට අනුව ඊට අවශ්‍ය රසායනික පොහොර යෙදිය හැකි ය.
C - මිලෙන් අඩු ය.
ඉහත වගන්ති අතරින් නිවැරදි වගන්ති වනුයේ,
(1) A හා B පමණි. (2) B හා C පමණි.
(3) A හා C පමණි. (4) සියලුම ප්‍රකාශ නිවැරදි ය.

18. A, B හා C ලෙස නම් කළ වල්පැළෑටිවල භෞතික ලක්ෂණ පහත වගුවේ දක්වා ඇත.

A	B	C
පත්‍ර සිහින් ය, දිග ය . නාරටි සමාන්තර ය	පත්‍ර සිහින් ය, දිග ය. නාරටි සමාන්තර ය.	පත්‍ර පළල් ය. නාරටි දැලක් ආකාර වේ.
කඳ සිලින්ඩරාකාර ය. ඇතුළත කුහර සහිත ය.	කඳ ත්‍රිකෝණාකාර ය. ඇතුළත කුහර නැත.	බොහෝ විට කඳ රවුම් ය. ඇතුළත කුහර නැත.

ඉහත දැක්වෙන පරිදි A, B හා C පිළිවෙළින් විය හැක්කේ,
(1) කුප්පමේනියා, තුනැස්ස හා බටදැල්ල ය. (2) බටදැල්ල, තුනැස්ස හා කුප්පමේනියා ය.
(3) කුප්පමේනියා, බටදැල්ල හා තුනැස්ස ය. (4) මොණරකුඩුම්බිය, තුනැස්ස හා කුප්පමේනියා ය.

19. ශාක රෝගවල පොදු ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A. ශාක කුරු වීම B. මුල්වල ගැටිති ඇතිවීම
C. පත්‍ර විචිත්‍රය D. අංගමාරය
ඉහත රෝග ලක්ෂණ අතරින් ශාක වෛරස් රෝග ලක්ෂණ වනුයේ,
(1) A හා C පමණි. (2) A හා D පමණි.
(3) B හා D පමණි. (4) B හා C පමණි.

20. ශාක රෝගයක්වන ඇන්ත්‍රැක්නෝස් රෝගයේ රෝග කාරකයා වනුයේ,
(1) කොලෙටෝට්‍රිකම් (Colletotrichum) ය. (2) පීතියම් (Pithium) ය.
(3) රයිසොක්ටෝනියා (Rhizoctonia) ය. (4) ෆියුසේරියම් (Fusarium) ය.

21. වී ප්‍රභේදවල දැකිය හැකි පොදු ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A - ශාක මිටි ය. B - පළිබෝධ හානි අඩු ය.
C - පඳුරු දැමීම අඩු ය. D - ධාන්‍ය , පිදුරු අනුපාතය වැඩි ය.
ඉහත ලක්ෂණ අතරින්, පාරම්පරික වී ප්‍රභේදවල දැකිය හැකි ලක්ෂණ වනුයේ,
(1) A හා B පමණි. (2) C හා D පමණි.
(3) B හා C පමණි. (4) A හා D පමණි.

22. BG 351 හා BG 450 යන වී ප්‍රභේද දෙකෙහි වයස පිළිවෙළින් මාස,
(1) 3 හා 4 කි. (2) 3 ½ හා 4 ½ කි.
(3) 3 හා 4 ½ කි. (4) 4 ½ හා 3 ½ කි.

23. පහත වර්ධක ප්‍රචාරණ ක්‍රම අතරින්, වර්ධක ප්‍රචාරණ ක්‍රමයට අදාළ උදාහරණ නිවැරදිව දක්වා ඇති වරණය වන්නේ,
A - කෝම - කිරි අල, අර්තාපල් B - රෛසෝම - ඉඟුරු , කහ
C - ධාවක - ගොටුකොළ, ස්ට්‍රෝබෙරි D - බල්බ - ලිලී, සුදු ලූණු
(1) A හා B පමණි. (2) B හා D පමණි.
(3) A, B හා C පමණි. (4) B, C හා D පමණි.

24. බද්ධ කිරීම සඳහා ග්‍රාහකයක් තෝරා ගැනීමේ දී සැළකිය යුතු සාධක කිහිපයක් පහත දැක් වේ.

A - ග්‍රාහකයේ අංකුර සක්‍රිය වීමට ආසන්න අවස්ථාවේ පැවතීම
B - රෝග හා කෘමි හානි ආදියට ඔරොත්තු දීම
C - අහිතකර පාංශු තත්ත්වවලට ඔරොත්තු දීමේ හැකියාව
D - ප්‍රමාණාත්මක හා ගුණාත්මකබවෙන් ඉහළ අස්වනු ලබා දෙන ප්‍රභේදයක් වීම

මේ ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,

(1) A හා B පමණි. (2) B හා C පමණි.
(3) A හා C පමණි. (4) A, B හා C යන සියල්ලම ය.

25. බෝග වගාවේ දී යොදා ගනු ලබන තාවකාලික ආරක්ෂිත වගා ව්‍යුහ පමණක් අඩංගු වරණය කුමක්ද?

(1) ජේළි ආවරණ, පාත්ති ආවරණ, සූර්ය ප්‍රචාරක, දැල් ගෘහ
(2) තනි පැළ ආවරණ, පාත්ති ආවරණ, දැල් ගෘහ, පොලිතීන් ගෘහ
(3) තනි පැළ ආවරණ, ජේළි ආවරණ, පාත්ති ආවරණ, සූර්ය ප්‍රචාරක
(4) සූර්ය ප්‍රචාරක, වීදුරු ගෘහ, දැල් ගෘහ, පාත්ති ආවරණ

26. බෝග වගාවේ දී පටක රෝපණය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - අධික පැළ සංඛ්‍යාවක් ලබා ගත හැකිවීම
B - රෝගී මවු ශාකයකින් වුව ද නීරෝගී පැළ ලබා ගත හැකිවීම
C - වෙනත් වර්ධක ප්‍රචාරණ පැළ හා සැසඳීමේ දී ඵල දැරීමට ගතවන කාලය අඩු වීම
D - පැළ ගබඩා කිරීම හා ප්‍රවාහනය පහසුවීම

ඉහත ප්‍රකාශ අතරින් පටක රෝපණයේ වාසි වන්නේ,

(1) A, B හා C ය. (2) B, C හා D ය.
(3) A, C හා D ය. (4) A, B හා D ය.

27. “ශෂ්‍ය බෝග මාරුව” නිවැරදිව අර්ථ දක්වා ඇත්තේ පහත කුමන වාක්‍යයෙන්ද?

(1) කිසියම් පිළිවෙලක් අනුව, තෝරා ගන්නා ලද බෝග කිහිපයක් එකම භූමියේ කන්නයෙන් කන්නයට මාරු කරමින් වගා කිරීම ය.
(2) යම් භූමියක බෝග වර්ග දෙකක් හෝ වැඩි ගණනක් නිසි පරතරයක් නොමැතිව වගා කිරීම ය.
(3) එක් බෝගයක ජීවන චක්‍රය අවසන්වීමට පෙර තවත් බෝගයක් පළමු බෝග අතර සංස්ථාපනය කරමින් බෝග වර්ග දෙකක් හෝ කිහිපයක් එකම භූමියක වගා කිරීම ය.
(4) කිසියම් ක්ෂේත්‍රයක එක් බෝගයක් පමණක් අඛණ්ඩව වගා කිරීම ය.

28. බෝගවල පසු අස්වනු හානිය කෙරෙහි පසු අස්වනු සාධක මෙන්ම පෙර අස්වනු සාධක ද බලපායි. මෙම සාධක සම්බන්ධයෙන් නිවැරදි වරණය තෝරා දක්වන්න.

(1) පෙර අස්වනු සාධක - බෝග තෝරා ගැනීම, පොහොර යෙදීම, පාංශු සාධක, අස්වනු නෙළීම
(2) පෙර අස්වනු සාධක - ජල සම්පාදනය, පොහොර යෙදීම, කෘෂි රසායන භාවිතය, කාළගුණික සාධක
(3) පසු අස්වනු සාධක - අස්වනු ඇසිරීම, කෘෂි රසායන භාවිතය, කාළගුණික සාධක, අස්වනු ප්‍රවාහනය
(4) පසු අස්වනු සාධක - ජල සම්පාදනය, කෘෂි රසායන භාවිතය, ගබඩා කිරීම, අස්වනු සැකසීම

29. පහත සඳහන් විටමින්, ඒවායේ ක්‍රියාකාරීත්වය සහ ඌනතා ලක්ෂණ නිවැරදිව දක්වා ඇති වරණ තෝරා දක්වන්න.

	විටමින වර්ගය	ක්‍රියාකාරීත්වය	ඌනතා ලක්ෂණ
A	A	සමේ හා අක්ෂිවල නීරෝගීතාව	තමස් අන්ධතාවය, ශ්වසන රෝග ඇතිවීම
B	C	දත් හා අස්ථි වර්ධනයට	අස්ථි දුර්වල වීම
C	D	කැල්සියම් හා පොස්පරස් අවශෝෂණය	දත් හා අස්ථි දිරා යාම
D	K	රුධිරය කැටිගැසීමට	රුධිරය කැටි ගැසීම ප්‍රමාද වීම

(1) A, B හා C ය. (2) B, C හා D ය. (3) A, B හා D ය. (4) A, C හා D ය.

30. ශරීර ස්කන්ධ දර්ශකය (Body Mass Index – B.M.I) නිර්ණය කිරීමේ සමීකරණය හා ඒකක නිවැරදිව දක්වා ඇත්තේ පහත කුමන ප්‍රකාශයෙන්ද?

(1) $\text{BMI} = \dfrac{\text{ශරීර බර (kg)}}{\text{උස}^2\ (\text{m}^2)}$ (2) $\text{BMI} = \dfrac{\text{ශරීර බර}^2\ (\text{kg}^2)}{\text{උස (m)}}$

(3) $\text{BMI} = \dfrac{\text{ශරීර බර}^2\ (\text{kg}^2)}{\text{උස}^2\ (\text{cm}^2)}$ (4) $\text{BMI} = \dfrac{\text{ශරීර බර (g)}}{\text{උස (cm)}}$

31. ආහාර විෂ වීම පිළිබඳව පහත දක්වා ඇති ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය කුමක්ද?

(1) මඤ්ඤොක්කාවල අඩංගු ලිනමරින් නිසා නිපදවෙන සයනයිඩ සංයෝග විෂ සහිත ය.
(2) සෝයා බෝංචිවල අඩංගු රීයම් වැනි බැර ලෝහ ආහාරවලට මිශ්‍ර වීම නිසා ආහාර විෂ වීම සිදු වේ.
(3) හාල්මැස්සන් සමඟ තක්කාලි නිතර නිතර ආහාරයට ගැනීම නිසා නිපදවන කැල්සියම් ඔක්සලේට් වකුගඩුවල තැන්පත් වීමෙන් මුත්‍රා ගල් සෑදේ.
(4) ආහාර මත ඇතැම් ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය නිසා ආහාර විෂ වීම සිදු වේ.

32. කිරි ආහාර, පැස්චරීකරණය මගින් කල් තබා ගැනීම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.

A. රෝග කාරක ක්ෂුද්‍ර ජීවීන් සම්පූර්ණයෙන් ම විනාශවන අතර ක්ෂුද්‍ර ජීවීන්ගේ බීජාණු විනාශ නොවේ.
B. ක්ෂුද්‍ර ජීවීන් හා බීජාණු සම්පූර්ණයෙන් විනාශ නොවන නිසා සාමාන්‍ය පරිසර උෂ්ණත්වය යටතේ තැබූ විට ඉක්මනින් නරක් වේ.
C. පැස්චරීකෘත ආහාර මාස 8 – 12 ක් පමණ කාලයක්, සාමාන්‍ය පරිසර උෂ්ණත්වය යටතේ වුව ද නරක් නොවී තබා ගත හැකි ය.

ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශ වන්නේ,

(1) A හා B ය. (2) B හා C ය.
(3) A හා C ය. (4) A, B හා C සියල්ලම ය.

33. එළවළු ශීතනය මගින් ද මස් හා මාළු අධිශීතනය මගින් ද පරිරක්ෂණය කරනු ලැබේ. මෙහි දී උෂ්ණත්ව අගයන් පිළිවෙළින්,

(1) 4°C හා -18 °C (2) -18°C හා 4 °C ය. (3) 0°C හා 100 °C ය. (4) -10°C හා 10 °C ය.

34. ඉන්දීය ගව වර්ග හා සැසඳීමේ දී යුරෝපීය ගව වර්ග පිළිබඳව නිවැරදි වගන්තිය කුමක් ද?

(1) ඉහළ පරිසර උෂ්ණත්වවලට ඔරොත්තු දෙයි.
(2) මොල්ලිය හා තැල්ල මනාව වැඩී ඇත.
(3) කිරි නිෂ්පාදනය වැඩි ය.
(4) කිණිතුළු උණ හා බාහිර පරපෝෂිතයන්ට ඔරොත්තු දෙයි.

35. ගව දෙනුන්ට වැළඳෙන පරිවෘත්තීය රෝගයකි,

(1) ගව රක්තාශ්‍රය. (2) බුරුළු ප්‍රදාහය.
(3) කිරි උණ. (4) කුර හා මුඛ රෝගය.

36. දිනක් වයසැති කිකිළි පැටවුන් බිත්තර දැමීම දක්වා පාලනය කිරීමේ දී එක් එක් අවධි නිවැරදිව දැක්වෙන්නේ පහත වගුවේ කුමන පේළියෙහි ද?

	පැටවු අවධිය (සති)	වර්ධක අවධිය (සති)	බිත්තර දමන අවධිය (සති)
(1)	0 - 2	2 – 8	8 න් පසු
(2)	0 - 4	4 - 18	18 න් පසු
(3)	0 - 6	6 - 8	8 න් පසු
(4)	0 - 8	8 - 18	18 න් පසු

37. එක් කිරි මුරයක දී නිපදවනු ලබන සාමාන්‍ය කිරි නිෂ්පාදනය අනුව එළ ගව වර්ග ආරෝහණ පිළිවෙළින් නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

(1) ෆ්‍රීෂියන්, අයර්ෂයර්, ජර්සි, රතු සින්දි
(2) රතු සින්දි, ජර්සි, අයර්ෂයර්, ෆ්‍රීෂියන්
(3) අයර්ෂයර්, ෆ්‍රීෂියන්, රතු සින්දි, ජර්සි
(4) ජර්සි, ෆ්‍රීෂියන්, අයර්ෂයර්, රතු සින්දි

38. එක්තරා ගොවිපොළක කුකුළු පැටවු රැළක් මළානිකව, උදාසීනව, ආහාර නොගෙන තටු පොරවාගෙන සිටි අතර ලේ මිශ්‍ර මළපහ ද පිට විය. දින 5ක් 10ක් ගතවන විට රැළෙන් 70% ක් පමණ මිය ගියේය. මොවුනට වැළඳුන රෝගය විය හැක්කේ,

(1) රැනිකට් රෝගය ය.
(2) කොක්සිඩියෝසිස් රෝගය ය.
(3) පටි පණු රෝගය ය.
(4) පුල්ලෝරම් රෝගය ය.

39. ආහාර ඇසුරුම හා ඒ තුළ අන්තර්ගත කර ඇති ආහාර ද්‍රව්‍යය ඉහළ උෂ්ණත්වයකට පත් කර පරිරක්ෂණය කරනු ලබන්නේ,

(1) රික්ත තත්ත්ව යටතේ ඇසිරීමේ දී ය.
(2) නවීකෘත අභ්‍යන්තර පරිසර තත්ත්ව යටතේ ඇසිරීමේ දී ය.
(3) අපූති තත්ත්ව යටතේ ඇසිරීමේ දී ය.
(4) වාත ප්‍රතිරෝධී තත්ත්ව යටතේ ඇසිරීමේ දී ය.

40. 1980 අංක 26 දරන ආහාර පනතෙහි දක්වා ඇත්තේ,

(1) පාරිභෝගික රුචිකත්වය වර්ධනය වන පරිදි ආහාර සැකසීමේ දී පිළිපැදිය යුතු නීති රීති වේ.
(2) පාරිභෝගික සෞඛ්‍යාරක්ෂිතභාවය සඳහා ආහාර සම්බන්ධව පිළිපැදිය යුතු නීති රීති වේ.
(3) සෞඛ්‍යාරක්ෂිතව ආහාර ඇසුරුම්කරණය සඳහා පිළිපැදිය යුතු කරුණු වේ.
(4) සෞඛ්‍යාරක්ෂිතව ආහාර පරිරක්ෂණය සඳහා පිළිපැදිය යුතු කරුණු වේ.

කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය II

පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. එක්තරා පාසලක කෘෂි විද්‍යා විෂයය හදාරන සිසුන් පිරිසක් විසින් ආදර්ශ ගොවිපොළක ක්ෂේත්‍ර චාරිකාවක දී දක්නට ලැබුණු විවිධ දේ පහත ආකාරයට වගුගත කරන ලදී.

(A)	(B)	(C)	(D)	(E)
වගා කර ඇති බෝග	**උපකරණ**	**කෘමීන්**	**වල් පැළෑටි**	**ගොවිපොළ සතුන්**
මුං ඇට	වර්ෂාමානය	ඉල්මැස්සා	කළාඳුරු	ගවයින්
මඤ්ඤොක්කා	අනිලමානය	එපිලැක්නා	විඩේලියා	එළුවන්
කෙසෙල්	සුළං දිශා දර්ශකය	අවුලකපෝරා	කුප්පමේනියා	කුකුළන්
වම්බටු	තැටි නගුල	පළඟැටියා	මොණරකුඩුම්බිය	හාවුන්
මිරිස්	කොකු නගුල		බැලතණ	
මෑ කරල්	රොටවේටරය			
	රේක්කය			

(i.) ඉහත A හි දක්වා ඇති බෝග අතරින් ෆැබේසියේ කුලයට හා සොලනේසියේ කුලයට අයත් වන බෝග දෙක බැගින් දක්වන්න.
  a. ෆැබේසියේ කුලය
  b. සොලනේසියේ කුලය

(ii.) B හි සඳහන් කර ඇති කාලගුණික උපකරණවලින් මනිනු ලබන පරාමිතිවලට අමතරව දිනපතා මැන ගත යුතු තවත් කාලගුණික පරාමිති දෙකක් ලියා දක්වන්න.

(iii.) ඉහත සඳහන් කර ඇති, උපකරණ අතරින් යන්ත්‍ර බලයෙන් ක්‍රියා කරන, ද්විතියික බිම් සැකසීමේ උපකරණ දෙකක් දක්වන්න.

(iv.) කුකර්බිටේසියේ කුලයේ බෝගවල ඵලවලට හානිකරන ඉහත වගුවේ C හි සඳහන්වන කෘමියා නම් කර, එම හානිය වැළැක්වීමට යොදා ගත හැකි යාන්ත්‍රික ක්‍රමයක් ලියන්න.

(v.) කුකර්බිටේසියේ බෝගවලට හානි කරන කෘමීන් පාලනය කරනු ලබන හිතකර සතුන් දෙදෙනෙකු සඳහන් කරන්න.

(vi.) ඉහත වගුවේ D හි සඳහන් කර ඇති වල්පැළෑටි ජීවිත කාලය අනුව බෙදා වෙන් කර ලියන්න.

(vii.) එළවළු වගාවට හානි සිදු කරන ඉහත වගුවේ C හි සඳහන් නොවන අසම්පූර්ණ රූපාන්තරණය පෙන්වන වෙනත් කෘමි පළිබෝධයින් දෙදෙනෙකු නම් කරන්න.

(viii.) බිත්තර දමන කිකිළියන් ඇති කිරීම සඳහා යොදා ගන්නා සියුම් ක්‍රම දෙකක් නම් කරන්න.

(ix.) ගවයින් සඳහා යොදාගන්නා දළ ආහාරයක් හා සාන්ද්‍ර ආහාරයක් බැගින් නම් කරන්න.

(x.) මෙම ගොවිපොළේ අලෙවි කළ හැකි සත්ත්ව නිෂ්පාදන දෙකක් සඳහන් කරන්න.

2. බෝග වගාවේ දී දේශගුණය හා පාංශු සාධක කෙරෙහි අවධානය යොමු කිරීමෙන් වැඩි ඵලදාවක් ලබා ගත හැකි වේ.

(i.) ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ප්‍රධාන ක්‍රම තුන සඳහන් කරන්න.

(ii.) බෝග වගාවට ආලෝක තීව්‍රතාව හිතකර ලෙස බලපාන ආකාර තුනක් දක්වන්න.

(iii.) a. පාංශු වයනය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද ?
  b. පාංශු වයනය, රෝල් ක්‍රමය භාවිතයෙන් නිර්ණය කිරීමේ දී පහත සඳහන් පස් වර්ග රෝල් කිරීමේ දී දක්නට ලැබෙන නිරීක්ෂණ ඇඳ දක්වන්න.
  A. මැටි පස B. මැටි ලෝම පස C. වැලි ලෝම පස

3. ශ්‍රී ලංකාවේ සිදු කෙරෙන කෘෂිකර්මය යටතේ ගොවිතැන් පද්ධති කිහිපයක් හඳුනාගත හැකි ය. මෙම පද්ධති තුළ බෝග වගා කර ඇති අනුපිළිවෙළ වගා රටා ලෙස හැඳින්වේ.

(i.) සමෝධානිත ගොවිතැන් ක්‍රමය යන්න හඳුන්වා, එම ක්‍රමයේ වාසි දෙකක් සඳහන් කරන්න.

(ii.) ශෂ්‍ය මාරු වගා ක්‍රමයේ සිවු බෝග මාරුව සඳහා යොදා ගන්නා බෝග කාණ්ඩ සඳහන් කර, එම බෝග කාණ්ඩ සඳහා උදාහරණ ලෙස බෝග වර්ගය බැගින් දක්වන්න.

(iii.) සංරක්ෂණ ගොවිතැන් ක්‍රමයේ අරමුණු තුනක් සඳහන් කරන්න.

4. ශාක ප්‍රචාරණය සඳහා සුදුසු රෝපණ ද්‍රව්‍ය තෝරා ගැනීම හා යොදා ගැනීම බෝග වගාවේ දී ඉතා වැදගත් වේ.

(i.) බීජ ප්‍රරෝහණයට අත්‍යවශ්‍ය සාධක සඳහන් කරන්න.

(ii.) මුං බීජ රෝපණ ද්‍රව්‍ය ලෙස යොදා ගැනීමට පෙර ඒවායේ ප්‍රරෝහණ ප්‍රතිශතය සෙවීම සඳහා, භාවිත කරනු ලබන පෙට්‍රි දීසි ක්‍රමය කෙටියෙන් විස්තර කරන්න.

(iii.) නිර්පාංශු වගාව සඳහා යොදා ගන්නා රෝපණ මාධ්‍යයක තිබිය යුතු ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

5. මිනිසාගේ ප්‍රෝටීන අවශ්‍යතාව සපුරා ගැනීමේ දී කිරි, බිත්තර හා මස් ආදී සත්ත්වමය ආහාර ද ඉතා වැදගත් වේ.

(i.) සත්ත්වමය ආහාර, පාරිභෝගිකයන් අතර ප්‍රචලිත කිරීම සඳහා ඒවා විවිධාංගීකරණය කර ගත හැකි ආකාර හයක් ලියන්න.

(ii.) සත්ත්වමය ආහාර නිෂ්පාදන ලබා ගැනීමට අමතරව ගොවිපොළ සතුන් ඇති කිරීමේ වෙනත් ප්‍රයෝජන හතරක් ලියන්න.

(iii.) ඝන ආස්තරණ ක්‍රමයට කුකුළන් ඇති කිරීමේ දී යොදාගනු ලබන අතුරණුවක තිබිය යුතු ලක්ෂණ හතරක් ලියන්න.

6. කරවිල, වම්බටු හා තක්කාලි ආදී බෝගවල අස්වනු නෙළීමෙන් පසුව විශාල ප්‍රමාණයක් අපතේ යයි. විවිධ පරිරක්ෂණ ක්‍රම යෙදීම මගින් මෙසේ අපතේ යාම අවම කළ හැකි ය.

(i.) a. ඉහත අස්වනු නෙලූ පසු හානි සිදු විය හැකි අවස්ථා දෙකක් සඳහන් කරන්න.

b. එම එක් එක් අවස්ථාවේ දී අස්වනු හානි අවම කිරීමට ගත හැකි ක්‍රියාකාරකමක් බැගින් සඳහන් කරන්න.

(ii.) a. කරවිල, තක්කාලි යන බෝග අස්වනු පරිරක්ෂණය කළ හැකි ක්‍රමයක් බැගින් ලියන්න.

b. වම්බටු පරිරක්ෂණය සඳහා සැකසීමේ දී කැපුම් පෘෂ්ඨය මතුපිට කහට පිපීම වැළැක්වීම සඳහා සිදු කළ හැකි ප්‍රතිකර්මයක් සඳහන් කරන්න.

(iii.) a. එළවළු අස්වනු ප්‍රවාහනය සඳහා ප්ලාස්ටික් කූඩා වඩා සුදුසු බව නිර්දේශ කර ඇත. ඒවා භාවිතයේ ඇති වාසි දෙකක් සඳහන් කරන්න.

b. ප්‍රෝටීන් කැලරි මන්දපෝෂණය නිසා දරුවන් තුළ ඇති විය හැකි රෝගී තත්ත්ව දෙකක් සඳහන් කරන්න.

7. බෝග වගාවේ දී ඉහළ අස්වැන්නක් ලබා ගැනීම සඳහා බිම් සැකසීමේ සිට අස්වනු නෙළීම දක්වා ක්‍රියාවලිය මනාව කළමනාකරණය කළ යුතු ය.

(i.) a. බෝගවලට ප්‍රධාන වශයෙන් නයිට්‍රජන්, පොස්පරස් හා පොටෑසියම් පෝෂක ලබා දිය යුතු වේ. මාෂ බෝග අස්වනු නෙළීමෙන් පසු ඉතිරිවන අවශේෂ පසට යට කිරීමෙන් සපුරාගත හැක්කේ ඉහත කුමන පෝෂකය ද?

b. එළවළු බෝග වගාවේ දී පොස්පරස් පෝෂකය ලබාදීමට යෙදිය හැකි රසායනික පොහොර වර්ගයක් ලියන්න.

(ii.) a. පහත සඳහන් බෝග සඳහා යොදා ගත හැකි පාත්ති වර්ග ලියන්න.

1. තක්කාලි
2. රටකජු

b. ගොඩබෝග සංස්ථාපනයට යොදා ගත හැකි උපකරණයක් නම් කරන්න.

c. එළවළු වගාව සඳහා යොදා ගත හැකි පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රම දෙකක් ලියන්න.

(iii.) a. වී වගාවට වැළඳෙන බැක්ටීරියා රෝගයක් හා දිලීර රෝගයක් නම් කරන්න.

b. වී වගාවේ පළිබෝධ පාලනය සඳහා යොදා ගත හැකි රසායනික නොවන ක්‍රම දෙකක් ලියන්න.

අ.පො.ස. (සා.පෙළ) පෙරහුරු ප්‍රශ්න පත්‍රය - 2020

කෘෂි හා ආහාර තාක්ෂණය (81)

1 පත්‍රය - පිළිතුරු

ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය
1	2	11	1	21	3	31	2
2	3	12	3	22	2	32	1
3	2	13	2	23	4	33	1
4	4	14	3	24	2	34	3
5	1	15	4	25	3	35	3
6	3	16	1	26	4	36	4
7	2	17	1	27	1	37	2
8	2	18	2	28	2	38	2
9	2	19	1	29	4	39	3
10	3	20	1	30	1	40	2

කෘෂි විද්‍යාව
ව්‍යුහගත රචනා ප්‍රශ්න සඳහා ලකුණු පටිපාටිය

1. i ෆැබේසියේ - මුං ඇට, මෑ කරල්
සොලනේසියේ - වම්බටු, මිරිස්
ii උෂ්ණත්වය, ආර්ද්‍රතාවය, ආලෝක තීව්‍රතාව
iii. කොකු නගුල, රොටවේටරය
iv ඉල්මැස්සා
යාන්ත්‍රික ක්‍රම - එල ආවරණය, පස පෙරළීම, හානි වූ එල විනාශ කිරීම, පෙරමෝන උගුල් ඇටවීම
v. දිමියන්, බත්කූරන්, ලේඩි බර්ඩ්, කුරුමිණියන්, මකුළුවන්, කුරුල්ලන්
vi. වාර්ෂික - කුප්පමේනියා, මොණර කුඩුම්බිය, බැලතණ
බහු වාර්ෂික - කළාදුරු, විඩේලියා
vii සුදු මැස්සා, කුඩිත්තා, පස්මුළු මකුණා, කොළ එළවළු මකුණා, රතු කපු මකුණා, පිටි මකුණා
viii ඝන ආස්තරණ ක්‍රමය, තට්ටු ක්‍රමය, කූඩු ක්‍රමය (තනි/සමූහ)
ix දළ ආහාරයක් - තෘණ, පිදුරු, රනිල, හේ
සාන්ද්‍ර ආහාරයක් - පුන්නක්කු, සහල් නිවුඩු, මොලෑසස්
x. කිරි, මස්, බිත්තර, යෝගට් නිෂ්පාදන

(ලකුණු 2x10 = 20)

2. i. 1. මෝසම් වැසි (නිරිත දිග හා ඊසාන දිග මෝසම් වැසි)
2. සංවහන වැසි
3. වා සුළි වැසි (ලකුණු 1x3 = 03)

ii.
- ආලෝකය ප්‍රභාසංස්ලේෂණයට අත්‍යාවශ්‍ය ය.
- ශාකවල ක්ලෝරෝෆිල් හා ඇන්තොසයනින් වර්ණක නිෂ්පාදනයට අවශ්‍ය ය.
- ධාන්‍ය බෝගවල පඳුරු දැමීම වැඩි වේ, පත්‍ර ක්ෂේත්‍රඵලය වැඩි වේ.
- සංචිත ආහාර ප්‍රමාණය වැඩි වේ.
- විසිතුරු පත්‍රික ශාකවල වර්ණවත්බව වැඩිවීමට අවශ්‍ය ය. (ලකුණු 1x3 = 03)

iii. a. පසේ අඩංගු වැලි, රොන් මඩ, හා මැටි අංශුවල එනම් ඛණිජ අංශුවල සාපේක්ෂ ව්‍යාප්තිය පාංශු වයනය ලෙස හැඳින්වේ. (ලකුණු 01)

b. A. B. C.

(ලකුණු 1x3 = 03)
(මුළු ලකුණු 10)

3. i එක් නිෂ්පාදනයක අතුරු එල වෙනත් නිෂ්පාදනයක අමුද්‍රව්‍ය ලෙස යොදා ගනිමින් එකම භූමියක් තුළ බෝග වගාව, සත්ත්ව පාලනය, බල ශක්තිය නිෂ්පාදනය හා පොහොර නිෂ්පාදනය ආදී ක්‍රියාවලි ඒකාබද්ධව සිදු කිරීම ය. (ලකුණු 01)

- පසේ භෞතික, රසායනික හා ජෛවීය ගුණාංග දියුණු වීම
- යොදන සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට හැකි වීම
- සමබල ආහාර වේලක් ලබා ගැනීමට හැකිවීම
- වසර පුරා ආදායම් ලැබීම
- ගොවියාගේ අවදානම හා අඩමානය අඩු වීම
- ගොවිපළ තුළම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය නිසා පරිසර හානිය අඩු වීම (ලකුණු 1x2 = 02)

ii.

කාණ්ඩය	බෝග
ධාන්‍ය	බඩ ඉරිඟු, ඉදල් ඉරිඟු, කුරක්කන්
රනිල	බෝංචි, මුං, කව්පි, මෑ
අල	අර්තාපල්, ඉන්නල, මඤ්ඤොක්කා
වෙළෙඳ /එළවළු බෝග	මිරිස්, මාළු මිරිස්, තක්කාලි, කරවිල

ගැලපෙන වාර්ෂික බෝගවලට ලකුණු ලබා දෙන්න (ලකුණු ½ x 8 =04)

iii
- පාංශු ඛාදනය වැළැක්වීම
- පසේ සරුබව සුරැකීම
- පොහොර ගොවිපොළෙන්ම සපයා ගැනීම
- පෝෂණීය සමබල ආහාර වේලක් ලබා ගැනීම
- අවශ්‍ය දර ගොවිපොළෙන්ම ලබා ගැනීම
- බෝග විවිධාංගීකරණයක් ඇති කර ගැනීම (ලකුණු = 03)

(මුළු ලකුණු 10)

4. i.
- බීජයේ ජීව්‍යතාවය
- තෙතමනය / ජලය
- වාතය / ඔක්සිජන්
- උෂ්ණත්වය (මෙම පිළිතුර ප්‍රමාණවත් ය.) (ලකුණු ½ x 4 = 02)
- ආලෝකය (මෙය අත්‍යාවශ්‍ය නොවුව ද ලියා ඇතිනම් ලකුණු ලබා දෙන්න.)

ii. පෙට්‍රි දීසියක් හෝ දෙකක් මත තින්ත පොවන කඩදාසියක් එලා ඒ මත පොඟවා ගත් මුං බීජ 50ක් හෝ 100 ක් අතුරා, ඒ මතට ජලය ඉස පෙට්‍රි දීසි පියනෙන් වසා තබනු ලැබේ. දින දෙක තුනකට පසු දීසි විවෘත කර ප්‍රරෝහණය වී ඇති බීජ සංඛ්‍යාව ගණනය කර පහත පරිදි ප්‍රතිශත ගණනය කරනු ලැබේ.

$$\text{මුං බීජවල ප්‍රරෝහණ ප්‍රතිශතය} = \frac{\text{ප්‍රරෝහණය වූ බීජ සංඛ්‍යාව}}{\text{යොදා ගත් බීජ සංඛ්‍යාව}} \times 100$$

(ලකුණු 04)

iii
- මනා වාතනයක් පැවතීම
- මනා ජල වහනය
- ජලය රඳවා ගැනීමේ හැකියාව
- ස්වාරක්ෂක ගුණය පැවතීම
- පළිබෝධවලින් තොර වීම (ලකුණු 1x4 = 04)

(මුළු ලකුණු 10)

5. i. කිරි වලින් - මුදවාපු කිරි, යෝගට්, රස කළ කිරි(වැනිලා / චොකලට්/ පළතුරු මිශ්‍ර)
මස් - සොසේජස් , මීට් බෝල්ස්, තුනපහ මිශ්‍ර මීට් බෝල්ස්, දුම් ගැසූ මස් , හැම් , බේකන්
(ලකුණු 1/2 x 6 =03)

ii. රැකියා අවස්ථා සැපයීම
උපකරණ ක්‍රියාත්මක කිරීමට සත්ත්ව බලය ලබා ගැනීම
ගව පාලනයේ දී විවිධ කර්මාන්ත සඳහා අවශ්‍ය සම් ලබා ගත හැකි වීම
සත්ත්ව ඇටකටු හා ලේ, පොහොර ලෙස ලබා ගත හැකි වීම
සත්ත්ව මල ද්‍රව්‍ය කාබනික පොහොර ලෙස ගත හැකි වීම (ලකුණු 1 x 3 = 03)

iii.
- කුඩා කැබලිවලින් යුක්ත වීම
- දූවිලි ආකාරයෙන් නොතිබීම
- කුකුළන් ආහාරයට ගන්නා ද්‍රව්‍යයක් නොවීම
- වියළි තත්ත්වයේ පැවතීම
- අපද්‍රව්‍යවලින් තොරවීම
- තෙතමනය උරා ගැනීමේ හැකියාව
- පහසුවෙන් සොයා ගත හැකි වීම
- මිල අඩු වීම (ලකුණු 1 x 4 = 04)

(මුළු ලකුණු 10)

6. i. a. අස්වනු සැකසීමේ දී, ඇසිරීමේ දී, ප්‍රවාහනයේ දී, ගබඩා කිරීමේ දී , අලෙවි කිරීමේ දී (ලකුණු ½ x 2 =01)

b. අස්වනු සැකසීම - අස්වනු පිරිසිදු කිරීම
අස්වනු ඇසිරීම - සුදුසු ඇසුරුම් ද්‍රව්‍ය භාවිත කිරීම
අස්වනු ප්‍රවාහනය - එළවළු හා පළතුරු ප්‍රමාණය ඉක්මවා පැටවීම සිදු නොකිරීම
ගබඩා කිරීම - ගබඩා තුළ උෂ්ණත්වය ආර්ද්‍රතාවය බෝගයට සුදුසු පරිදි සැකසීම
අලෙවි කිරීම - එළවළු, පලතුරු අස්වනු විවෘතව තබා අලෙවි නොකිරීම
(නිවැරදි ක්‍රියාකාරකම් සඳහා ලකුණු දෙන්න) (ලකුණු 1 x 2 = 02)

ii. a. කරවිල - වියළීම, ශීත කිරීම
තක්කාලි - ජෑම් සෑදීම, සෝස් සෑදීම, ශීත කිරීම (ලකුණු 1 x 2 = 02)

b. බ්ලාන්චීකරණය (උණු ජලයේ ගිල්වීම) (ලකුණු 1)

iii. a. 1. අස්වනු තැලීමකට ලක් නොවී ප්‍රවාහනය කළ හැකි වීම
2. වැඩිකලක් භාවිත කළ හැකි වීම
3. අට්ටි ගැසීමේ දී යාන්ත්‍රික හානිවලට ඔරොත්තු දීම
4. හැසිරවීමට පහසු වීම
5. හොඳින් වාතනය වීම (ලකුණු 1 x 2 – 02)

b. 1. මැරුස්මස්
2. ක්වෝෂියෝකෝර් (ලකුණු ½ x 2 = 02)

(මුළු ලකුණු 10)

7. i. a. නයිට්‍රජන් (ලකුණු = 01)
b. සාන්ද්‍ර සුපර් පොස්ෆේට් (ලකුණු 01)

ii. a. තක්කාලි - උස් පාත්ති
රටකජු - ඇලි හා වැටි (ලකුණු ½ x 2 =01)

b. FMRC ගොඩ බීජ වප්කරය (ලකුණු =01)
c. ඇලි හා වැටි ජල සම්පාදනය
තීරු ජල සම්පාදනය (ලකුණු 1 x 2= 02)

iii. a. දිලීර රෝග - කොළ පාළුව, කොපු අංගමාරය, දුඹුරු පුල්ලි රෝගය
බැක්ටීරියා රෝග - බැක්ටීරියා කොළ අංගමාරය (ලකුණු = 02)

b. යාය එකට වගා කිරීම
ප්‍රතිරෝධී ප්‍රභේද වගා කිරීම
සමතුලිත පොහොර මිශ්‍රණ යොදා ගැනීම
පැළ අතර පරතරය වැඩි කිරී ම
ජලය බැඳ තැබීම
ලණු ගෑම / කුළු ගෑම (ලකුණු 1x 2= 02)

(මුළු ලකුණු 10)